# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1641/48 - 2010 පෙබරවාරි 18 වැනි බ්‍රහස්පතින්දා - 2010.02.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

නියෝග අංක 10.

**2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

20 (5) වන වගන්තිය යටතේ නියෝගය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 20 (5) වැනි වගන්තිය මගින් සලසා ඇති විධිවිධාන ප්‍රකාර ක්‍රියාකරමින් කිසිදු නිෂ්පාදකයකු වෙළෙන්දකු හෝ බෙදා හරින්නකු විසින් සම සහිත අධිශීත කළ බ්‍රොයිලර් කුකුළු මස් (සම්පූර්ණ කුකුළා හෝ කුකුළාගෙන් අඩක් - කුකුළාගේ උරෝස්ථිය සහ කොඳු ඇට පෙළ දිගේ දික් කැපුමක් මගින් ලබාගත් භාග කොටසක් හෝ කුකුළාගෙන් හතරෙන් පංගුවක් - කුකුළාගේ අර්ධයක් හරස් කැපුමක් මගින් වෙන් කොට ලබාගත් පාදය සහ ළපැත්ත ඇතුළත් හතරෙන් පංගුව) ග්‍රෑම් 100 ක් රු. 35/-ක (කිලෝ ග්‍රෑම් එකක් රු. 350/-ක) උපරිම සිල්ලර මිලකට වඩා ඉහළ මිළකට අලෙවි කිරීම, අලෙවිය පිණිස තැබීම හෝ අලෙවිය සඳහා ඉදිරිපත් කිරීම, ප්‍රදර්ශනය කිරීම සිදු නොකළ යුතු බවට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මෙයින් නියෝග කරනු ලැබේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්සූක්,
සභාපති.

2010 පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹ දී ය.

03-196